චක්‍රලේඛ අංක : 05/2017

සමූපකාර සේවක කොමිෂන් සභාව(බ:ප:),
අංක 109 , හතර වන මහල,
මහ වීදිය,
බත්තරමුල්ල.
2017. 03/31

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

## උසස් අධ්‍යාපන සුදුසුකම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිරි දීමනා ගෙවීම.

ශීර්ෂගත කාරණයට අදාලව නිකුත් කරන ලද 4/2009 චක්‍රලේඛය අනුව උසස් අධ්‍යාපන සුදුසුකම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිරි දීමනා ගෙවීම පහත පරිදි සංශෝධනය කිරීමට මෙම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

| | ලබාගත යුතු සුදුසුකම් (1) | එක්වරක් පමණක් ගෙවන දීමනාව (2) | දීමනාවක් වශයෙන් ගෙවිය යුතු වැටුප් වර්ධක ගණන (3) |
|---|---|---|---|
| 1 | සමූපකාර සේවයින්ගේ දැනුවත් බව වැඩිකරලීම සඳහා, පහත 03 යටතේ විස්තර කරන ආයතනවලින් සිය තනතුරට අදාලව සමත්වූ ඩිප්ලෝමා පාඨමාලා | | |
| | • මාස 06 සිට අවු.01 දක්වා කාලය | රු.1500.00 | 01 |
| | • වසරකට වැඩි කාලයක් සඳහා | රු.2000.00 | 01 |
| 2 | පශ්චාත් උපාධි සහතිකය | රු.3500.00 | 02 |
| 3 | වරලත් ගණකාධිකරණය හා ඒ හා සමාන වෙනත් විභාගවල අවසන් සහතිකය | රු.3500.00 | 02 |
| 4 | ගෞරව උපාධිය | රු.2500.00 | 02 |
| 5 | සාමාන්‍ය උපාධිය හා ඒ හා සමාන පාඨමාලා | රු.2000.00 | 01 |
| 6 | සමූපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල ඩිප්ලෝමා | රු.1750.00 | 03 |
| 7 | සමූපකාර උසස්පෙළ (පූර්ණ සාමාර්ථය) | රු.1500.00 | 02 |
| 8 | සමූපකාර සාමාන්‍ය පෙළ (පූර්ණ සාමාර්ථය) | රු.1250.00 | 01 |

02. වැටුප් වර්ධක අගය මත හිමිවන ඉහත වගුවේ (3) තීරුවේ සඳහන් දීමනාව, මූලික වැටුපට එකතු නොකළ යුතු අතර, එය වෙනම දීමනාවක් වශයෙන් මාසික වැටුප සමඟ ගෙවිය යුතු වේ.

03. අනෙකුත් ආයතන.

i. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
ii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය
iii. ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය
iv. ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය
v. සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය

vi. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් තනතුරට අදාල ක්ෂේත්‍රයේ පාඨමාලා

vii. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් ලබාගත් තනතුරට අදාල ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා

viii. කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අධ්‍යාපනික හා වෘත්තීය පුහුණු ආයතන

04. කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමේදී සමු.සේ.කො.ස.01 ආකෘතිපත්‍රය සමඟ පහත සඳහන් විස්තරද ඒ සමඟ ඉදිරිපත් කලයුතුය.

I. කොමිෂන් සභාවේ අනුමත පත්වීම් ලිපියේ පිටපත

II. ලබා ඇති අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල සහතික කරන ලද පිටපත්

III. මෙම සුදුසුකම් තනතුරේ හා ආයතනයේ කාර්ය ඵලදායකත්වය කෙරෙහි දැනට හෝ ඉදිරියේදී බලපෑ හැකි අන්දම

IV. ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන තිබේද යන්න

V. අධ්‍යක්ෂක මණ්ඩල තීරණය

06. ඉහතින් දක්වා ඇති සුදුසුකම් යම් තනතුරකට බඳවා ගැනීමේදී මූලික සුදුසුකම් ලෙස සලකා ඇත්නම් මෙම දීමනාව හිමි නොවේ.

07. මෙම චක්‍රලේඛයේ සඳහන් දීමනා ක්‍රමය 2017.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර 4/2009 චක්‍රලේඛය මින් අවලංගු වේ.

කොමිෂන් සභා නියමය පරිදිය.

එස්.ඒ.එල්.රංගනී,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.

II. ලේකම්, සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.

III. සමූපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.

IV. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ ගම්පහ/ කළුතර)

V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.

VI. ලේකම්, මධ්‍යම රජයේ සමූපකාර සේවක කොමිෂන් සභාව.

VII. සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.

VIII. සියළුම වෘත්තීය සමිති සංගම්

සාමාන්‍යාධිකාරී මඟින්,

ගරු සභාපති,

....................................................... සමුපකාර සමිතිය මඟින්,

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව.

<u>උසස් අධ්‍යාපන සුදුසුකම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිරි දීමනා ලබා ගැනීම.</u>

මා විසින් සපුරා ඇති පහත සඳහන් සුදුසුකම් වෙනුවෙන්, බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක: ............. අනුව හිමි දීමනා ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

i. ලබා ඇති සුදුසුකම :
ii. සුදුසුකම් ලබා ගත් දිනය :
iii. සුදුසුකම් ලබා ගත් ආයතනය :
iv. කොමිෂන් සභා අනුමත තනතුර :

මා සේවයට බඳවා ගැනීමේ දී සුදුසුකමක් වශයෙන් මෙම සුදුසුකම සලකා බලනු නොලැබුණු බවත්, මාගේ තනතුරේ හා ආයතනයේ කාර්ය ඵලදායකත්වය ඉහළ නැංවීම සඳහා මෙම සුදුසුකම මඟින් මනා උපයෝජනයක් සැලසීමට වග බලා ගන්නා බවටත්, මෙහි සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මෙයින් දන්වා සිටිමි.

............................ (අත්සන)

තනතුර

දිනය

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව.

පහත සඳහන් ලිපිලේඛන මේ සමඟ අමුණා ඇති අතර, මෙම නිලධාරියා / නිලධාරිණිය බඳවා ගැනීමේ දී සුදුසුකමක් වශයෙන් ......................................................... සුදුසුකම සලකා බලනු නොලැබුණු බවත්, ඔහු ගේ / ඇය ගේ තනතුරේ හා ආයතනයේ කාර්ය ඵලදායකත්වය වර්ධනයට මෙම දීමනාවෙන් මනා පිටුවහලක් ලබා ගත හැකි වන බවත්, මෙම දීමනා ගෙවීමට ප්‍රමාණවත් ආර්ථික ශක්‍යතාවයක් ඇති බවට සෑහීමකට පත් වන බවත් දන්වා සිටිමි.

i. කොමිෂන් සභාවේ අනුමත පත්වීම් ලිපියේ පිටපත - ඇමුණුම 01
ii. ලබා ඇති අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල සහතික කරන ලද පිටපත් - ඇමුණුම 02
iii. අධ්‍යක්ෂක මණ්ඩල තීරණය - ඇමුණුම 03

.......................................................

සාමාන්‍යාධිකාරී

.......................................................

සභාපති

.........................................................................සමුපකාර සමිතිය